

ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත බලතල සහිත, පූර්ණ වශයෙන් රජය සතු සමාගමකි. ආයතනයේ දැක්ම වනුයේ තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිතුශ්‍රීලී ගුවන් සේවා හවුල්කරුවා වීමයි.

ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ඉහළම දක්ෂතා ඇති පුද්ගලයින් බඳවා ගන්නා අතර, අපි සියලු දෙනාටම සමාන අවස්ථා ලබා දෙන සේවා ආයතනයකි.

ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ අදියර II සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පහත සඳහන් අනුරූපක කණ්ඩායම (Counterpart Team) සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සිවිල් සහ ව්‍යුහාත්මක ඉංජිනේරු (කොන්ත්‍රාත් පදනම)
02. යාන්ත්‍රික ඉංජිනේරු (කොන්ත්‍රාත් පදනම)
03. විදුලි ඉංජිනේරු (කොන්ත්‍රාත් පදනම)
04. විද්‍යුත් ඉංජිනේරු (කොන්ත්‍රාත් පදනම)
05. පද්ධති ඉංජිනේරු (කොන්ත්‍රාත් පදනම)
06. ගණකාධිකාරී (කොන්ත්‍රාත් පදනම)

කොන්ත්‍රාත් කාලසීමාව - වසර 02

වැටුප

තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂනීය වැටුපක් හිමිවේ.

පොදු කරුණු

මෙම තනතුරු සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවශ්‍ය වූ විට සමාගමට අයත් දවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක සේවය කළ යුතුවේ.

මෙම තනතුරු සඳහා අදාල වන සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළුව වැඩිදුර තොරතුරු අප ආයතනික වෙබ් අඩවියේ (www.airport.lk>Corporate>Careers) සඳහන් වේ. ඔබ විසින් අදාල සුදුසුකම් හා පළපුරුද්ද, ලබා තිබේ නම් වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පත්‍රයක් අදාල සහතික වල ජායා පිටපත් සහ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ජායාරූප දෙකක් (02) සමඟ පහත සඳහන් ලිපිනයට 2026 දෙසැම්බර් මස 11 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **ඔබ අයදුම්කරන තනතුර** සඳහන් කළ යුතුවේ.

සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ජායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ ලියාපදිංචි තැපෑලෙන් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් බාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම පුරප්පාඩු දැන්වීම අවලංගු කිරීම හෝ නැවත කැඳවීමේ පූර්ණ අයිතිය සමාගම සතු වේ.

තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අයදුම්කරුවන් හට පමණක් දැනුම් දෙනු ලැබේ.

සභාපති
ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ
කටුනායක

Gazette.lk
SINCE 2015
AMBITIONS REALIZED
Advertised on 22/11/2026